සියලු හිමිකම් ඇවිරිණි. [All right reserved]

කැලණිය අධ්‍යාපන කලාපය Kelaniya Education Zone කැලණිය අධ්‍යාපන කලාපය Kelaniya Education Zone කැලණිය අධ්‍යාපන කලාපය Kelaniya Education Zone

# කැලණිය අධ්‍යාපන කලාපය
# Kelaniya Education Zone

## දෙවන වාර පරීක්ෂණය – 2024
## Second Term Test – 2024

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade } 7 | විෂයය Subject } ගණිතය Mathematics | කාලය Time } පැය 02 |

**නම / විභාග අංකය :**.......................................................................................

### I පත්‍රය

- 1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- 1 සිට 20 තෙක් ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ. (2 x 20 = 40)

1) පහත වෘත්තයේ දී ඇති අක්ෂරවලින් දැක්වෙන්නේ කුමක්දැයි නම් කරන්න.




O - ................................................

BC -................................................

2) ද්විපාර්ශ්වික සමමිතියක් නැති රූප යටින් ඉරක් අඳින්න



3) බිස්කට් පෙට්ටියක ස්කන්ධය $200\,g\;750\,mg$ වන අතර ඇසුරුමේ ස්කන්ධය $1g\;250\,mg$ වේ. බිස්කට්වල පමණක් ස්කන්ධය සොයන්න.

4) $p \times p \times p$ දර්ශක ආකාරයෙන් ලියන්න.

5) මල් පාත්තියක දිග හා පළල පිළිවෙලින් $9\,cm$ හා $4\,cm$ වෙයි. එම වර්ගඵලය හා සමාන වර්ගඵලයක් ඇති වෙනත් සෘජුකෝණාස්‍රාකාර මල් පාත්තියක දිග $12\,cm$ නම් පළල සොයන්න.

6) පහත විෂම භාගය, මිශ්‍ර සංඛ්‍යාවක් ලෙස ලියන්න.

$$\frac{15}{8}$$

7) හිස්තැන් පුරවන්න.

$3.8 \times 10 =$ ………………………

$3.8 \times 100 =$ ………………………

8) සුළු කෝණී ත්‍රිකෝණය තෝරා යටින් ඉරක් අඳින්න.




9) 4 න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

4800 1624 187 95

10) ක්‍රි. ව. 2800 අධික අවුරුද්දක් බව කමල් පවසයි. එම ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද? හේතු දක්වන්න.

11) හිස්තැන් පුරවන්න.

$$x + 5 = 8$$
$$x + 5 - \square = 8 - \square$$
$$x = \square$$

12) සුළු කරන්න.

| $l$ | $ml$ |
|---|---|
| 8 | 250 |
| +3 | 450 |
| | |

13) විසඳන්න.

$$2\frac{7}{8} - 1\frac{4}{8}$$

14) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් කුලකයක් නම් √ ලකුණ ද නැත්නම් × ලකුණ ද යොදන්න.

| ප්‍රකාශය | √ හෝ × |
|---|---|
| රස පලතුරු | |
| 1 - 10 අතර ප්‍රථමක සංඛ්‍යා | |
| දේදුන්නේ පාට | |

15) මේසයක දිග $3m\ 55cm$ වේ. අල්මාරියේ දිග $2m\ 65cm$ වේ. මේසයේ දිග, අල්මාරියට වඩා කොපමණ වැඩිද?

16) පහත සංඛ්‍යාවල මහා පොදු සාධකය සොයන්න.

8 ,12

17) $K\hat{L}M = 75^\circ$ වන කෝණය, කෝණමානය භාවිතයෙන් ඇඳ නම් කරන්න.

18) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් පිළිතුරු ලබා ගන්න. $(-3) + (+5)$




19) රූපයේ දී ඇති ඝනකාභයේ පරිමාව සොයන්න..




20) සෘජුකෝණාස්‍රයක දිග $a$ හා පළල $b$ වේ. පරිමිතිය සඳහා $a$ හා $b$ ඇසුරින් ප්‍රකාශනයක් ලියන්න.



## II පත්‍රය

- **ප්‍රශ්න හයකට** පමණක් පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් හිමිවේ.
- ගණිතය II පත්‍රයට පිළිතුරු වෙනත් කඩදාසියක ලියා එය I පත්‍රයට අමුණන්න.

1) (a) (i) පහත සමචතුරස්‍රයේ වර්ගඵලය සොයන්න.




(ල.02)

(ii) අඳුරු කළ රූපයේ වර්ගඵලය සොයන්න.




(ල.03)

(b) (i) පරිමාව $24cm^3$ වූ ඝනකාභයක දිග, පළල හා උස සඳහා සුදුසු අගයන් තුනක් ලියන්න. (ල.02)

(ii) දිග $10m$ ද, පළල $8m$ ද, පරිමාව $400m^3$ ද වූ ඝනකාභ හැඩැති ටැංකියක උස සොයන්න.
(ල.03)

---

2) (i) සුළු කරන්න. $2x + 3y + 4x - 2y$ (ල.02)

(ii) රුපියල් $a$ බැගින් වූ පැන්සල් 3ක් ද, රුපියල් $b$ බැගින් වූ පොත් 5ක් ද ගැනීමට අවශ්‍ය මුළු මුදල වීජීය ප්‍රකාශනයකින් ලියන්න. (ල.03)

(iii) විසඳන්න : $3x - 8 = 10$ (ල.03)

(iv) මෙම ත්‍රිකෝණයේ පරිමිතිය $P$ නම් ඒ සඳහා සූත්‍රයක් ගොඩනගන්න.




(ල.02)

---

3) (i) 12 සාධක දෙකක ගුණිතයක් ලෙස ආකාර දෙකකට ලියන්න. (ල.02)

(ii) 20 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ලියන්න. (ල.02)

(iii) 18 සහ 12 සංඛ්‍යා දෙකේ මහා පොදු සාධකය සොයන්න. (ල.03)

(iv) බස් නැවතුම්පළකින් මිනිත්තු 10කට හා මිනිත්තු 15කට වරක් ගම්පහ, නුවර යන නගර වෙත බස් රථ පිටත්වේ. පෙ.ව. 7.00 ට මෙම බස් නැවතුම්පළින් එක විට බස් රථ දෙකක් පිටත් වූයේ නම් නැවත එක විට බස්රථ පිටත්වන්නේ කොපමණ වේලාවකට පසුවද? (ල.03)

4) (a) (i) පහත දී ඇති වාක්‍යය, ඔබේ පිළිතුරු පත්‍රයේ පිටපත් කරගෙන එහි හිස්තැන්වලට සුදුසු වචන යොදන්න.

කතුරකින් යමක් කපන විට, කතුරේ තල අතර ……………………………… (ගතික/ ස්ථිතික) කෝණ සෑදෙන අතර විදුලි පංකාවක් කැරකැවෙන විට විදුලි පංකාවේ පෙති අතර……………………………. (ගතික/ ස්ථිතික) කෝණ සෑදේ. (ල.02)

(ii) $A\hat{B}C = 40^0$ හා $P\hat{Q}R = 135^0$ කෝණ, කෝණමානය භාවිතයෙන් ඔබේ පිළිතුරු පත්‍රයේ ඇඳ නම් කරන්න. (ල.04)

(b) (i) පහත ත්‍රිකෝණ පාදවල දිග අනුව කුමන වර්ගයට අයත් දැයි ලියන්න.







(ල.02)

(ii) සමපාද ත්‍රිකෝණය, රොම්බසය, සෘජුකෝණාස්‍රය හා සමචතුරස්‍රය අතරින් සවිධි බහුඅස්‍ර තෝරා ලියන්න. (ල.02)

---

5) (i) $1.250g$, ග්‍රෑම් හා මිලිග්‍රෑම් වලින් ලියන්න. (ල.02)

(ii) නිමල් ආර්ථික මධ්‍යස්ථානයෙන් ගෙනා ද්‍රව්‍යවල බිල්පතක මෙසේ සඳහන් වී තිබුණි.

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| අල | $2kg\ 825g$ |
| ලූණු | $3kg\ 495g$ |

ඉහත සඳහන් ද්‍රව්‍යවල මුළු ස්කන්ධය සොයන්න. (ල.02)

(iii) $828cm$, මීටර හා සෙන්ටිමීටර වලින් ලියන්න. (ල.02)

(iv) කාන්තිගේ නිවසේ සිට කාර්යාලයට දුර $8km\ 125m$ වේ. ඇය නිවසේ සිට $6km\ 200m$ ක දුරක් බසයෙන් ගොස් ඉතිරි දුර පයින් ගමන් කර කාර්යාලයට ළඟා වේ. ඇය පයින් ගමන් කර දුර කොපමණ? (ල.02)

(v) සෘජුකෝණාස්‍රාකාර පිට්ටනියක දළ සටහනක් රූපයේ දැක්වේ. මෙහි පරිමිතිය සොයන්න. (ල.02)



6) (i) 2024 – 08 – 25 මේ දිනය අයත් වන දශකය හා සියවස ලියන්න. (ල.04)

(ii) අමිල මහතා 2020.05.01 දින විදේශගත වී සිට 2024.04.28 දින නැවත ශ්‍රී ලංකාවට පැමිණියේ නම් ඔහු විදේශගතව සිටි කාලය කොපමණද? (ල.03)

(iii) දිනකට මිනිත්තු 30 ක් වීඩියෝ ක්‍රීඩාවේ යෙදෙන පැතුම් 2024 වර්ෂයේ දී එම ක්‍රීඩාවේ යෙදෙන කාලය කොපමණද? එම කාලය පැයවලින් දක්වන්න. (ල.03)

7) (i) $1\frac{1}{4}$ වන මිශ්‍ර සංඛ්‍යාව, විෂම භාගයක් ලෙස දක්වන්න. (ල.02)

(ii) $\frac{3}{4},\frac{5}{8}$ යන භාග වලින් විශාලම භාගය සොයන්න. (ල.01)

(iii) පහත භාග සුළු කරන්න.

(a) $\frac{2}{5}+3\frac{1}{10}$ (ල. 03)

(b) $2\frac{2}{3}-1\frac{1}{2}+\frac{1}{4}$ (ල. 04)

8) (i) 72 ප්‍රථමක සාධකවල බලවල ගුණිතයක් ලෙස ලියා දක්වන්න. (ල.02)

(ii) $a = 3$ හා $b = 2$ නම් $2a^2 + b^2$ ප්‍රකාශනයේ අගය ලියන්න. (ල.02)

(iii) අගය සොයන්න.

a. $(-3) + (-8)$ (ල.01)

b. $(-10) + (+4)$ (ල.01)

c. $(-3.2) + (+2.5)$ (ල.02)

(iv) කියාරා, ශීතකරණය තුළ $-4.8$℃ ලෙස සටහන්ව තිබූ උෂ්ණත්වමානයක් පිටතට ගෙන නිවසේ බිත්තියේ එල්ලා තබයි. එහි මිනිත්තුවකට $0.5$℃ බැගින් උෂ්ණත්වමානයේ උෂ්ණත්වයේ ඉහළ යයි නම් මිනිත්තු 3 කට පසු උෂ්ණත්වමානයේ සටහන් වන උෂ්ණත්වය ලියා දක්වන්න. (ල.02)

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න